# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1824/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திகதி
Date — 10/12/2024
පැය 1350

## මාධ්‍ය නිවේදනය

### පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01. 2024.12.09 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 05 | 05 | 133 | 360 | තඹ දඟර 03<br>යකඩ බැරල් 06<br>බූලි 04 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.12.09 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ජාඇල පොලිස් වසමේ ඒකල ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලි ග්‍රෑම් 500 ක්, එම ජාවාරමෙන් උපයා ගත් බවට සැකකරන මුදල් රුපියල් 8,500/- ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ජාඇල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස 32 ක් වන මාකවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ජාඇල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03.** **බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කර ටිපර් රථයකට පටවා ප්‍රවාහනයට සූදානම් කරමින් සිටි සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා නෙල්ලිඅඩි කඳවුර.**

2024.12.09 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා නෙල්ලිඅඩි කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මරදන්කේනි පොලිස් වසමේ කුඩාඉරිප්පු වැලි පරය ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කර ටිපර් රථයකට පටවා ප්‍රවාහනය සූදානම් කරමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මරදන්කේනි පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස 45 ක් වන වැම්පියන්පත්තු ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මරදන්කේනි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04.** **රක්ෂිතයකට අනවසරයෙන් ඇතුළු වී නීති විරෝධී ලෙස ඉරන ලද තල් ලී ට්‍රැක්ටර් රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුර.**

2024.12.09 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මරදන්කේනි පොලිස් වසමේ වුන්ඩිකුලම් ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **රක්ෂිතයේදී බලපත්‍ර නොමැතිව නීති විරෝධි ලෙස ඉරන ලද තල් ලී 110 ක් ට්‍රැක්ටර් රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වුන්ඩිකුලම් වන ජීවී සංරක්ෂණ කාර්යාලය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස 35 ක් වන මුල්ලියන් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

**05.** **බලපත්‍ර නොමැතිව ටිපර් රථයකට පස් පටවා ටිපර් රථයකින් ප්‍රවාහනයට සූදානම් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුර.**

2024.12.09 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් තඹලගමුව පොලිස් වසමේ ගල්මැටියාව ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව ටිපර් රථයකට පස් පටවා ටිපර් රථයකින් ප්‍රවාහනයට සූදානම් කරමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන තඹලගමුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන කන්තලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

තඹලගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**